# අඳුරු උමගේ අභිරහස



ලෝචනී මින්දාරා රණතුංග

# අඳුරු උමගේ අභිරහස

ලෝචනී මින්දාරා රණතුංග.

**අඳුරු උමඟේ අභිරහස**

ISBN 978-624-206-582-3

9 786242 065823

**© ලෝචනී මින්දාරා රණතුංග**


| | |
|---|---|
| කවර නිර්මාණය | : ලෝචනී මින්දාරා රණතුංග |
| සංස්කරණය සහ සෝදුපත් බැලීම | : අජිත් කේ රණතුංග |
| ප්‍රකාශනය | : මහාමායා බාලිකා විද්‍යාලය<br>සංඝරාජ මාවත<br>මහනුවර |

2023-11-15

පිදුම

මනසින් ලෝකය දකින්නට
අවැසි ශිල්ප සතර ලැබ දුන්
සියළුම ගුරු
මෑණිවරුන්ට සහ පියවරුන්ට

## පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායී පුරවැසියෙකු, සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් පිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මඟපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය, ගුරු භවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරු භවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමඟින් පිරිනමමි.

**ශෂිකලා සේනාධීර**
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
2023 . 11 . 01

"අම්මා! කවදද මගේ යාළුවෝ එන්නෙ. මම මේක ඔයාගෙන් කී සැරයක් ඇහුවද? හෙට එයි හෙට එයි කියනවා. මට දැන් හරි උත්තරයක් ඕන."
මම කෑ ගැසුවෙමි.

"කෑ ගහන්න එපා ළමයෝ, මුළු ගමම දෙදරනවා."
අම්මා කීවාය.

"අනේ අම්මේ, කියන්නකෝ..."
මම ඇවිටිලි කළෙමි.

"හරි එහෙනං කෝල් කරල බලන්නකො."

මම දුව ගොස් දුරකතනයෙන් ඔවුන් එකිනෙකා ඇමතුවෙමි.

"හෙට එනවා". ඒ ඔවුන්ගේ පිළිතුරයි.

මම සතුටින් ඉපිලී ගියෙමි. එම දිනය ගෙවෙන තුරු බලා සිටියේ නොඉවසිල්ලෙනි. මා හිමිදිරියේ ම පිබිදුණේ කුමන වේලාවේද යන්න මට මතක නැත. කඩිමුඩියේ දත් මැද මුහුණ සෝදා ගත් මම කුස්සියට දිව්වෙමි.

"ඔයා කවදාවත් මෙච්චර උදෙන් නැගිටලා නෑනෙ."
අම්මා කීවාය.

"අද නැගිට්ටනේ..."
මම කීවෙමි.

පැයකට දෙකකට පසු අම්මා ළඟට ගිය මම "අම්මා මම යාළුවන් එනවද කියල බලන්න බස් හෝල්ට් එකට යන්නද ?" යි ඇසුවෙමි.

"හා පරෙස්සමට ගිහිං බලන්න".

අම්මා අවසර දුන්නේ උපදෙසක් ද සමඟිනි.

මම දුව ගොස් පෝනි කරත්තය ගෙන ගේට්ටුව ඇර වේගයෙන් කරත්තය පැදවූයෙමි. බස් හෝල්ට් එක ළඟ නැවතුනු මා කරත්තයෙන් බැස දිව්වෙමි.

නවතන ලද බසයෙන් අත් කිහිපයක්ම පිටතට මතුවුණි. ඔව්, ඒ මගේ යහළුවන් ය. මම සතුටින් ඉපිලී ගියෙමි. ඔවුන්ගේ අත් වල ගමන් මලු රාශියක් තිබුණි.

"ගොඩ කාලෙකට නවතින්න වගේ." මම කීවෙමි.

"ඇයි හොඳ නැද්ද?" ඒ දුලන්දි ය.

"නෑ එහෙම නෙවෙයි." මම කීවෙමි.

මම ඔවුන් අත තිබුණු ගමන් මලු රැගෙන කරත්තයේ තැබුවෙමි.

"ඇයි නගින් නැද්ද?" මම ඇසුවෙමි.

ඔවුහු කරත්තයට නැඟ ගත්හ.

"හරි, දැන් මේ පෝනි කරත්තය පදවන කෙනා එනකම් අපි හොඳ කයියක් දාමු." ටෙනුරි කීය.
"දැනටමත් ඇවිල්ල ඉවරයි"
මම කීවෙමි.

"කොයි, කවුරුත් නෑනෙ" දුල්මිනී වට පිට බලමින් ඇසීය.

"ඇයි මේ ඉන්නෙ" මම මටම අත  තබා ගත්තෙමි.

"ඔයා" යහළුවෝ එකවර ඇසූහ.

"ඔව් මම තමයි. අපි දැන් යමු." කියත්ම කරත්තය ඉදිරියට ඇදී ගියේය.

"මං හිතුවෙ ඔයා විහිළු කරා කියල." තිසලි පුදුම වෙමින් කීය.

අපි වට පිට සිරි නරඹමින්, තොරතුරු කතා කරමින් ම ගෙදර ගියෙමු.

"ආ... ආව නේද. හරි, දැන් ගිහින් ඇඟ පත සෝදගෙන ඇඳුමක් දාගෙන එන්න. කෑම කන්න."
අම්මා කීවාය.

යහළුවෝ සහ මම කෑම කෑමෙන් පසු හති වැටෙන තුරු සෙල්ලම් කළෙමු.

පසුව දා හිමිදිරියේ ම මා පිබිදෙන විටත් දුල්මිණි, දුලන්දි සහ විහාරා අවදි වී සිටියෝය.

"නැගිටිනව හොර පූසි." මම ටෙනුරි කුද්දමින් කීවෙමි.

අපි අනෙත් අය ද කුද්දා ඇහැරුවෙමු.
"අපරාදෙ හොඳ හීනෙ කෑව." දැහැමි මැසිවිලි නඟමින් නැඟිට්ටා ය.

අපි මූණ කට සෝදා ගෙන කුස්සියට දිවුවෙමු. අම්මා අපට කිරි සාදා දුන්නා ය.

"ඔයාලට සතුටු හිතෙන ආරංචියක් තියනවා." අම්මා සිනාවකින් මුව සරසාගෙන කීවාය.

"ඒ මොකද්ද." අපි සියල්ලෝම අම්මා දෙස බලා එක්වර ඇසුයෙමු.

"අපි අද යනවා ගමේ මුත්තලාගෙ ගෙදර." අම්මා කීවාය.

"මුත්තලාගෙ ගෙදර? මම හිතුවෙ මුත්ත මැරිලත් ඉවරයි කියලා. මම එහෙට කවදාවත් ගිහිල්ලත් නෑ." මම කීවෙමි.

"මොකද නැත්තෙ; ඔයා ගිහිල්ල තියනව. ඔයාට මතක නැතුව ඇති."
අම්මා පැවසුවාය.

"එහෙම වෙන්නත් පුළුවන්. ඒක නෙවෙයි, මුත්ත තාමත් ඉන්නවද ?" මම ඇසුවෙමි.

"මුත්ත නම් නැහැ, හැබැයි පුංචි අම්ම ඉන්නව ඒ ගෙදර." අම්මා කීවාය.

"හා හා ඔයාල දෙන්නගෙ විකාර සාකච්ඡාවට අපි ගන්නෙ නැද්ද? " දුල්මිණි ඇසුවාය.
"හරි හරි ඉක්මනින් යන්න ඕනි නම්, බෑග් හදා ගන්න. එහෙ මෙහෙට වඩා හොඳට දුවල පැනල සෙල්ලම් කරන්න පුළුවන්. දොළේ බැහැල නාන්නත් පුළුවන්." අම්මා කීවාය.

අපි ඉක්මනින්ම බෑග් ලෑස්ති කර ගත්තෙමු. වෑන් රථය පැමිණි විගස අපි පිටත් වුණෙමු.

ටික දුරක් සිංදු කියමින්, විනෝද වෙමින් ගිය පසු අපට නින්ද ගොස් තිබිණ. මුත්තලාගේ ගෙදරට පැමිණි පසු තාත්තා අපව අවදි කළේය.

රෑ කෑමෙන් පසු ටික වෙලාවක් කතා කරමින් සිටි අප ඉක්මණින් නින්දට ගියේ ගමන් මහන්සිය ද දැනුණු නිසාවෙනි.

හිමිදිරියේ අවදි වුණු පසු අපි මුහුණ සෝදන ස්ථානය නොදැන සිටි නිසා, කුණු කෙළ පිස දමමින් ම දෙමාපියන් සිටි ස්ථානයට ගියෙමු. ඔවුන් අපට පැවසුවේ, ඇළෙන් මුහුණ කට සෝදා ගන්නා ලෙසටයි.

අපි දත් බුරුසු ගෙන දත් මැද ඇළෙන් මුහුණ කට සෝදා ටික වේලාවක් කතා කර කර සිටියෙමු.

"අපි මෙතනින් නාගෙන ම යමුද ?"
පිහිනීමට පළපුරුද්ද ඇති දුලන්දි කීවාය.

"ඔව්නෙ ඇත්තට, අපි නාගෙනම යමු. මාළුත් එක්ක සෙල්ලම් කරලත් යමු." මම සරදමට කීවෙමි.

"මාළුත් එක්ක සෙල්ලම් කරන්න නම් බෑ" විහාරා කීවාය.

"විහාර බය වෙලා මේකේ මෝරු ඉන්නව කියල" මම කීවෙමි.

"කට වහගන්නව" විහාරා කෑ ගෑවාය.

"විහිළු නැතුව ගෙදර යමු අනේ" හිමන්ෂි කීවාය.

අපි ගෙදරට ගියෙමු.

උදේ ආහාරය ගත් පසු පුංචි අම්මා "අනේ දරුවනේ ඔයාලට ඉන්න තියෙන්නෙ එක කාමරයක; ඇඳවල් තුනක් නම් තියනවා. කමක් නැද්ද?" යි ඇසුවාය.

"කමක් නෑ, ඒ හොඳටම ඇති"

අපි කීවෙමු.

"අනේ දරුවනේ මට සමාවෙන්න, මට ඔයාලගෙ කාමරේ අස් කරන්න බැරි උණා. කාලෙකින් කාමරේ අස් කරේ නැත්තේ, මකුළු දැල් ටික කඩලා, අතුගාල තියනවා. ඒත් කාමරේ බඩු මුට්ටු එක ගොඩේ. මට මේ දවස් වල ටිකක් අසනීපයි. ඒකයි බැරි උණේ" පුංචි අම්මා කීය.

"කමක් නෑ පුංචි අම්මේ" අපි කීවෙමු.

"කොහෙද කාමරේ තියෙන්නෙ" තිසලි ඇසුවාය.

"උඩ තට්ටුවේ පළවෙනියට තියන කාමරේ".

"හරි අපි බලන්නම්" කියා අපි උඩට දිව්වෙමු.

"හරි දැන් වැඩ පටන් ගමු" මම කීවෙමි.

අපි ඇඳවල් තුන එක පෙළට සිටින සේ තබා, අල්මාරිය ඇඳන් වලට ඉදිරිපසින් තබා, එයට විරුද්ධ පැත්තෙන් කණ්නාඩිය තබන්නටත්, මේසය ජනේලය අසල තැබීමටත් තීරණය කළෙමු.

බිත්තිය මුල්ලට කර තිබූ බඩු මුට්ටු අපි තීරණය කළ ආකාරයට තැබුවෙමු.

"දැන් තියෙන්නෙ අල්මාරිය තියන්න" මම පැවසුවෙමි.

අපි අට දෙනාම එකතු වී අල්මාරිය තල්ලු කළෙමු.

දුල්මිණී දුටු දෙය අපට පෙන්නූ විට අප පුදුමයට පත් වුණෙමු.

එය පිටුපස තිබුනේ දොරටුවකි! එය රහස් දොරටුවක් වැනි එකකි.

වැඩිහිටියෙකුට නම් එයට ඇතුළු විය හැක්කේ දෙකට නැමීමෙනි. දොරටුවේ යතුර එය ආසන්නයේම තිබිණී.

"අපි මේක දැන්ම අරින්න හොඳ නැහැ. අපි මේක ඇතුලට ගියහම කොයි වෙලාවෙ එන්න පුලුවන් වෙයිද දන්නෙ නෑ. අපි නෑ කියල දැන ගත්තොත් දෙමවුපියො කලබල වෙයි. මං ගාව

සැලැස්මක් තියනවා. මම ඒක පස්සෙ කියන්නම්. අපි දැන් මේ අල්මාරිය තිබුණ තැනම තියමු. එතකොට මේක පේන්නෙ නෑනෙ. අපි දැන් යමු ඇලේ නාන්න" මම කීවෙමි.

අපි ඇලේ බැස නෑමෙන් අනතුරුව දහවල් ආහාරය ගත්තෙමු. ඉන් පස්සුව ටෙනුරි, "දැන් ඔයාගෙ සැලැස්ම කියන්න" යැයි ඇවිටිලි කළාය.

යහළුවන් සමඟ මා කාමරයට ගිය පසු මගේ සැලැස්ම ඔවුන්ට කීවෙමි.

"අපි හෙට අම්මලාට කියමු අපි ගම වටේ පොඩි රවුමක් යනවා කියලා, ගිහින් එන්නෙ හවස් වරුවේ කියලා කියමු. කෑම ටිකකුත් ඉල්ලගෙන යමු. ඊට පස්සෙ හැංගිලා ඉඳලා හොරෙන්ම ඇවිත්, අර අඹ ගහේ තියන ඉණිමගෙන් මේ කාමරේ ජනේලයට පැන ගමු. කාමරේ ඇතුලට ඇවිත් අපේ වැඩේ පටන් ගමු." මම එක හුස්මට කියාගෙන ගියෙමි.

"හොඳ අදහස, ඒත් මට බයත් හිතෙනවා" දුල්මිණී කීය.

"අපි දැන් ගිහිල්ල සෙල්ලම් කරමු" හිමන්ෂි කීවාය.

පසුවදා පිබිදුණු පසු අපි අම්මලාගෙන් බොරු ගමනට අවසර ගත්තෙමු.

අපි කෑම ද රැගෙන කඩුල්ලෙන් පැන පාරට ගොස් සැඟවී සිට ඉණිමගෙන් කාමරයට ගොස් කුතුහලයත් බියත් සිතේ ඇතිව දොරටුව විවෘත කළෙමු. ඇතුළ ඝන අඳුරෙන් පිරී තිබුණි. කණ්නාඩි මේසය ළඟ තිබුණ විදුලි පන්දම් දෙක රැගෙන ආ තිසලි, එකක් මට දුන්නාය.

ඉදිරියෙන් ගමන් කළ මා හට තරමක බියක්ද ඇති වුණි.

"ඔයාලා හිතන්නෙ අපි මේ රහස් උමඟ දිගේ ගිහින් කොහෙන් මතු වේවිද?" දුල්මිණී ඇසුවාය.

"අනේ මට නම් මුකුත් හිතා ගන්න බෑ" දැහැමි කීවාය.

"ඒක නෙවෙයි, ඇයි පුංචි අම්මා මේ ගැන අපිට නොකිව්වේ? හරි නම් එයා මේක ගැන අපිට කියන්න ඕනිනේ. නැත්තන් මේක ගැන අපිට දැනගන්න ඉඩ නොතියා ඉන්න ඕන." මම මගේ සැකය අන් අයට පැවසුවෙමි.

"අනේ මන් දන්නෙ නෑ, මට මුකුත් හිතා ගන්න බෑ." හිමංෂි කීවාය.

අපි අඳුර මැදින් ඉදිරියටම ගමන් කළෙමු. ටික දුරක් ගිය විට අපට හමු වූයේ තවත් දොරටුවකි.

"තවත් දොරක්" දුලන්දි කීවාය.

අපි දොරටුව ආසන්නයේම තිබී යතුරක් සොයා ගතිමු.

"අපි මේක හෙට අරිමු. අපි හෙටත් අම්මලාගෙන් මේ වගේ බොරු ගමනකට අවසර ගනිමු. ඊට පස්සෙ අද කළා වගේ මෙතැනට එමු." මම යෝජනා කලෙමි.

"එතකොට මේ කෑම? මෙච්චර කෑම උස්සගෙන ආවෙ නිකන්ද? " දුල්මිණී සහ ටෙනුරි එක්වරම ඇසූහ.

"නෑ, අපි ආයෙත් හොරෙන්ම පාරට පැනගෙන ගම වටේ පොඩි රවුමක් ගහමු. අරං ආව කෑම ටිකත් කාල ගෙදර එමු." මම කීවෙමි.
"ඒක හොඳ අදහස" සැවොම කීවෝය.

අපි එය එසේම කළෙමු.

ගම වටේ ගොස් නැවත නිවසට පැමිණෙන විට අප නාඳුනන කවුදෝ පැමිණී සිටිනවා අපි දුටුවෙමු. මම අම්මා ළඟට ගොස් ඒ කවුරුන්දැයි හොරෙන් ඇගෙන් විමසුවෙමි.

"ඒ මේ ගමේම ඉන්න කෙනෙක්. පුංචිගෙ හොඳ යාළුවෙක්. ඒ දෙන්න ඉස්සර කාලෙ ඉඳලම හොඳම යාළුවො දෙන්නෙක්. එයා අපිට දුරින් නෑදෑයෙකුත් වෙනවා" අම්මා පැහැදිලි කළාය.

"ආ, එහෙමද?"

"හරි දැන් ගිහිල්ල ඔය ළමයි ඇඟ පත සෝද ගන්න"
අපි ඇළට ගොස් සිත් සේ නා ගතිමු.

අළෙන් නාගෙන ආපසු ගෙදරට පැමිණෙන විටත් ආගන්තුකයා සිටියාය. අපි ඔවුන් සිටි තැන තිබූ පුටු කිහිපයක වාඩි ගත්තෙමු. ඔවුන්ගේ කතා බසින් අපට එම කාන්තාව ගැන දැන ගන්නට ලැබුණි.

ඇගේ සැමියා විද්‍යාඥයෙකි. ඔහු දැන් ලෝකයට ඉතාමත් වටිනා දෙයක් නිර්මාණය කරමින් සිටියි. එම නිර්මාණය ගැන බොහෝ කරුණු ද ඇය විසින් කියන ලද විස්තරයේ තිබුණි.

ඇය ගිය පසු අපි රෑ කෑම ගෙන කලින් ම නින්දට ගියෙමු.
පසු දින උදෑසන පිබිදුණු පසු අපි දත් මැද මුහුණ සෝදමින් සිටියෙමු. එවිට ඊයේ පැමිණි කාන්තාව කඩිමුඩියේ පැමිණියාය.
ඈ පුංචිටත් ඒ අසළට පැමිණි අම්මාටත් කීවේ "මගේ සැමියා හද හදා හිටපු නිර්මාණය අතුරුදහන් වෙලා! ඒක හොරු උස්සලා" කියාය.

ඇය ඉතා දුකින් එය පැවසූ විට අම්මාත් පුන්චීත් පුදුම වූහ.
අපි ද පුදුම වූයෙමු. ඔවුහු මේ ගැන බොහෝ වේලාවක් යනතුරු කතා කළහ.

"අද අපිට අරක බලන්න යන්න බැරි වෙයිද?" ටෙනුරි අපට පමණක් ඇසෙන සේ කොඳුරා ඇසුවාය.

"බැරි වෙයි වගේ" දුලිම්ණීත් මමත් එකටම කියා සුසුමක් හෙලුවෙමු.

අපේ සැලසුම් සුන් විය.

අපි වැඩිහිටියන්ගේ සාකච්ඡාව අවසන් වනතුරු බලා සිටියෙමු.
පසුව දුල්මිණීත් මමත් හැර අන් සියල්ලෝම මෙය අත්හැර දැමූහ. මම මෙය අත්හැර දැමීමට කිසිසේත් සූදානම් නුවූයෙමි.
මම කියවා ඇති පොත්වල මෙන් අභිරහසක් විසඳීමට සිහින මැවූයෙමි.

එසේ අභිරහසක් තම අත තිබියදීත් එය අත්හැර දැමීමට මගේ සිත ඉඩ නොදුන්නේය.

දුල්මිණී සහ මම ඔවුන් දිරි ගන්වා රහස් උමගේ අභිරහස හෙටට කල් දමා දවස පුරා සෙල්ලම් කළෙමු.

රෑ කෑමෙන් පසු අපි නින්දට ගියෙමු.

පසු දින උදෙන්ම අවදි වූ අපි කඩිමුඩියේ ලක ලෑස්ති වීමු.

"අද ම මේ උමගේ ගමන යන්නම ඕන." මම දැඩිව අදිටන් කර ගතිමි.

එදින උදයේ ද අපි දෙමාපියන්ගෙන් බොරු ගමනකට අවසර ඉල්ලා ගතිමු. පෙර දා මෙන්ම ඉණිමඟ යොදාගෙන උඩුමහලට පැමිණ අඳුරු උමඟ තුලට ඇතුළු වීමු.


පෙර දින පැමිණ නතර වූ දොරටුව ද විවර කර ගෙන ඉදිරියටම ගියෙමු. දොරටුව පසුකර සැතපුමක් පමණ දුරක් අප එන්නට ඇත. අඳුර තුලින් දිලිසෙන කුමක් හෝ පෙනිණ.

"අර මොකද්ද අර දිලිසෙන්නෙ?" විහාර ඇසුවාය.


"මමත් ඒ ප්‍රශ්නෙම තමයි මගෙන් ම අහගත්තෙ" ටෙනුරි කීවාය.

මම ඒ දීප්තිමත් එළිය දෙසට දුව ගියෙමි. ඉදිරියෙන් හමු වූයේ ශක්තිමත් යකඩ දැලකි. දැලෙන් එහා පැත්තේ දීප්තිමත් තරුවක් වැනි යමක් තිබුණි. යකඩ දැල තුළින් අත දමා මම එය ගන්නට උත්සහ කළෙමි. යහළුවෝ ද මා අසලට පැමිණියහ.

යකඩ දැළ අසළ තිබුණු යමක් දුල්මිණි අපට පෙන්වූවාය. එහි තිබුණේ කිසියම් රූප සටහන් සහිත බොත්තම් කිහිපයකි.



ඒ අසළම තිබී තවත් සටහනක් සොයා ගැනීමට අපට හැකි විය. එහි තිබුණේ මෙවන් සටහනකි.




"මේ සටහනේ තියන රටාව දැනගෙන මේ බොත්තම් ටිකෙන් හතරක් ඔබන්න ඕනි වෙන්න ඇති. එතකොට මේ දැළ ඇරෙනවා ඇති." දුල්මිණි කීවාය.

සටහන දෙස ඉතා පරීක්ෂාවෙන් බලා සිටි මට යම් රටාවක් තේරුම් ගත හැකි විය.

"හරි, මම රටාව හොයා ගත්තා" මම සතුටින් කීවෙමි.

"මොකද්ද? ... මොකද්ද?" ඔවුන් එකිනෙකා මගෙන් ප්‍රශ්න කළහ.

"2 ඉලක්කම් දෙක එකක් අනෙත් පැත්ත හරවලා එක ළඟ තැබුවම හාට් ලකුණක් හැදෙනවා.

7 ඉලක්කම් දෙක ඒ විදියටම පැත්ත හරවලා තැබුවම ත්‍රිකෝණයක් ලැබෙනවා.

1 ඉලක්කම් දෙකත් ඒ විදියටම තියල M අකුර හදා ගන්න පුළුවන්.

ඒ වගේම 3 ඉලක්කම් දෙක තියල අපිට 8 ඉලක්කම හදා ගන්න පුළුවන්" මම බෑගයේ තිබුණු කොළ කැබැල්ලක සටහන් කරමින් පහදා දුනිමි.

"ඔයා නම් මාර ළමයෙක් තමයි" දැහැමි කීවාය.

සටහනේ තිබුණු විස්තර ගලපමින් විහාරා බොත්තම් එකින් එක එබුවාය. අන්තිම බොත්තම ඔබනවාත් සමඟම දැළ ඈත්වී විවරයක් සෑදුණි.

සතුටින් ඉපිළ ගිය අප දිලිසෙන වස්තුවට සැනෙන් ලං වුණෙමු.
හිමන්ශි එය ආයාසයෙන් ඔසවන්නට තැත් කළාය.

"අම්මෝ මේකෙ බර." ඈ කීවාය.

දුලන්දිත්, හිමන්ශිත්, දැහැමි සහ විහාරා සමඟින් එකතු වී කෙසේ හෝ එය ඔසවා ගත්තෝය.

"දැන් අපි ඉක්මනට මෙතැනින් යමු." මම යෝජනා කළෙමි.

ටික දුරක් එය ඔසවාගෙන ගිය ඔවුන් එය අපට දුන්හ. මාරුවෙන් මාරුවට එය ඔසවා ගනිමින් අපි එය රැගෙන ගියෙමු. දැඩි වෙහෙසක් දරා අපි එය කාමරය තෙක්ම රැගෙන ආවෙමු.

"අපි මේ ගැන අම්මලාට කියනවද? ඕනෙ නැද්ද ?" ඒ විහාරා ය.

"කතා කරමු, කතා කරමු" මම කීවෙමි.

"අම්මා ...." මම උඩ සිටම කෑ ගෑවෙමි.

සැනෙකින් ඔවුන් අප සිටි කාමරයට පැමිණියහ.

"ඈ ළමයිනේ, ඔයාලා ගමන පිටත් වුණේ එළියෙන් නේද? අපිටත් නොපෙනී ම කොහොමද ආපහු උඩට ආවෙ? මොකද්ද ඔය දිලිසෙන දෙය?"

අම්මගෙන් පුරුදු ලෙසම ප්‍රශ්න වැලකි.

ඒ සමඟම එදා පැමිණි කාන්තාව සහ ඇගේ සැමියා පැමිණියහ.

"මේ තමයි මම හදමින් ඉඳිද්දි නැති වුණ මගේ නිර්මාණය! කොහෙන්ද ඔයාලට මේක හම්බ වුනේ?" ඔහු ඇසුවේය.

සිදු වුණු සියල්ල අකුරක් නෑර අපි ඔවුනට විස්තර කළෙමු.
ඔවුහු පුදුමයෙන් පුදුමයට පත් වූහ. වැඩිහිටියන්ට වංචා කොට බොරු ගමනකට අවසර ගැනීම නිසා අපි එම වරදට සමාව ඉල්ලුවෙමු.

"මේක එතැනට අරන් ගියේ කවුද?" ඔහු ඇසුවේය.

අපිත් ඔවුන් එකිනෙකාගේ මුහුණු බැලුවෙමු.

පුංචි අම්මා එවිට ඉදිරිපත් වී එය තමා විසින් කරන ලද වරදක් බව පැවසීය. තමන් විසින් එය නිර්මාණය කළ බව පවසා ලෝකප්‍රසිද්ධ වීමට සිතා මිතුරියගේ නිවසින් එය සොරකම් කොට අඳුරු ගුහාවේ තැන්පත් කළ බව ඇය පිළිගත්තාය.

අපි ඇයගේ වරද ට සමාව දුන්නෙමු. එහෙත් වැඩිහිටියන් සියල්ල එක්ව, නැවත මෙවන් වරදක් නොකිරීමට සිතට ගන්නා ලෙසට පුංචි අම්මාට දැඩි ලෙස අවවාද කලෝය.

එමෙන්ම සිදු වන්නට ගිය වංචාවක් සොයා ගත් එකට අපට ප්‍රසංශා කළා මෙන්ම වැඩිහිටියන්ට හොරෙන් නැවතත් මෙවන් ගමන් නොයන ලෙසට අපට ද අවවාද ලැබුණි.

**නිමි**

**පසුවදන**



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතර ම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැඳ පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවා යි පතමු.

මෙයට
**සෙනවිරත්න මහලේකම්**
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023 . 11 . 01